ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර

Sri Sumangala College - Panadura

ප්‍රථම වාර පරීක්ෂණය - 2020 මාර්තු

1st Term Test - March 2020

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය Grade: 10 | විෂයය Subject: බුද්ධ ධර්මය | පත්‍රය Paper: I | කාලය Time: පැය 01 |

නම :- .................................................................................... පංතිය :- ..........................

සැලකිය යුතුයි **:-**

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

**I කොටස**

---

01. "මෙවන් පුතකු ලද මවක් පියෙක් නිවුණෝ වෙති. ස්වාමියෙක් ඇති බිරිය ද නිවීම ලැබ සිටින්නියකි." යනුවෙන් ප්‍රකාශ කළේ,

 i. ප්‍රජාපතී ගෝතමිය විසිනි. ii. කිසා ගෝතමිය විසිනි.

 iii. යසෝදරා දේවිය විසිනි. iv. මහමායා දේවිය විසිනි.

02. තමා විසින් ම පිළිපැද ඇස්පනාපිට මෙලොව දී ම ප්‍රතිඵල දැකගත හැකි බැවින් ධර්ම රත්නය,

 i. ස්වක්ඛාත ii. අරහං වන සේක.

 iii. සන්දිට්ඨික වන සේක. iv. අකාලික වන සේක.

03. සිතෙහි කයෙහි නිදිමත ගතිය, උදාසීනකම පවතී නම් පාඩම් කළ දේ මතකයට නොඑයි. එම නිදිබර උදාසීනකම හැඳින්වෙන්නේ,

 i. කාමච්ඡන්දය ලෙස ය. ii. ව්‍යාපාදය ලෙස ය.

 iii. විචිකිච්චාව ලෙස ය. iv. ථිනමිද්දය ලෙස ය.

04. සසර දුකට හේතු වන රාගාදී කෙලෙස් මුල් සහමුලින් ම උදුරා දමා චිත්ත පාරිශුද්ධිය ඇති කරවන භාවනාව හඳුන්වන්නේ,

 i. විපස්සනා භාවනාව ලෙස ය. ii. සමථ භාවනාව ලෙස ය.

 iii. චිත්ත භාවනාව ලෙස ය. iv. සමාධි භාවනාව ලෙස ය.

05. "ඉතිපි සො භගවා" යන පාඨයෙහි ඇතුළත් බුද්ධ රත්නයේ ගුණ,

 i. හයකි. ii. අටකි. iii. නවයකි. iv. දහයකි.

06. “රහසත් පව් නොකොට....” යන කවිය ඇතුළත් වනු ලබන ග්‍රන්ථය වන්නේ,

i. බුදුගුණ අලංකාරය ii. ගුත්තිල කාව්‍යය

iii. ලෝවැඩ සඟරාව iv. සුභාෂිතය

07. සිදුහත් කුමරා නීති ශාස්ත්‍රය, කඩු ශිල්පය, දුනු ශිල්පය, ඇතුන් අසුන් හැසිරවීම යන ශිල්ප උගත් බමුණු පඬිවරයා වන්නේ,

i. සොත්ථිය බමුණු පඬිවරයා ය. ii. චංකී බමුණු පඬිවරයා ය.

iii. සර්වමිත්‍ර බමුණු පඬිවරයා ය. iv. සෝනදණ්ඩ බමුණු පඬිවරයා ය.

08. “රාහුලෝ ජාතං බන්ධනං ජාතං” යනුවෙන් ප්‍රකාශ කරන ලද්දේ

i. සිදුහත් කුමරා ය. ii. නන්ද කුමරා ය.

iii. දේවදත්ත කුමරා ය. iv. රාහුල කුමරා ය.

09. බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නයේ ගුණ ගණන වන්නේ,

i. විස්සකි. ii. විසි එකකි. iii. විසි තුනකි. iv. විසි හතරකි.

10. සමථ භාවනාව වඩන පුද්ගලයා තම චරිතයට අදාළව කර්මස්ථානයක් තෝරාගත යුතු ය. එම චරිත ගණන වන්නේ,

i. දෙකකි. ii. තුනකි. iii. පහකි. iv. හයකි.

11. තමාගේ අභිමතය පරිදි සාරමසක් මුළුල්ලේ භාවනා කොට ප්‍රතිඵල නොලැබූ සැරියුත් හිමියන්ගේ ගෝල නම (භික්ෂුව) වූයේ,

i. ස්වර්ණාකාර නම් හිමි නමක් ii. ධම්මාලංකාර නම් හිමි නමක්

iii. කස්සප නම් හිමි නමක් iv. සරණංකර නම් හිමි නමක්

12. පංච නීවරණ ධර්මවල සිව්වැන්න “උද්දච්ච කුක්කුච්ච” නමින් හැඳින්වේ. බුදුරජාණන් වහන්සේ විසින් එය උපමා කර ඇත්තේ,

i. බොර සහිත ජලයට ii. පාසි සහිත ජලයට

iii. වර්ණකයක් යෙදූ ජලයට iv. කැළඹී ඇති ජලයට

13. සුද්දෝධන රංතුමාගේ අභිලාශය වූයේ සිදුහත් කුමරා,

i. සක්විති රජෙකු වනු දැකීම ය. ii. සිටුවරයෙකු වනු දැකීම ය.

iii. බුද්ධත්වයට පත්වනු දැකීම ය. iv. බ්‍රාහ්මණයකු වනු දැකීම ය.

14. සිදුහත් කුමරාට සිය පිය රජතුමා විසින් සියලු සැප සම්පත්වලින් යුතු මාලිගා,

i. දෙකක් සාදවා දුන්හ. ii. හයක් සාදවා දුන්හ.

iii. හතරක් සාදවා දුන්හ. iv. තුනක් සාදවා දුන්හ.

15. "බඹරා මල නොතලා රොන් ගන්නා සේ" මෙම උපමාව වඩාත් ගැළපෙන්නේ භික්ෂූන් වහන්සේලාගේ,

i. ප්‍රත්‍ය පහසුකම් ලබා ගැනීමට ය. ii. ධර්ම දේශනා ක්‍රියාවලියට ය.

iii. ශාසනික සේවාවලට ය. iv. සමාජ සේවාවලට ය.

16. තෙරුවන් සරණ යන තැනැත්තාගේ හෝ තැනැත්තියගේ හෝ සිත තුළ ප්‍රධාන වශයෙන් ඇති විය යුත්තේ,

i. ශ්‍රද්ධාව සහ කරුණාවයි. ii. කරුණාව සහ ප්‍රඥාවයි.

iii. ශ්‍රද්ධාව සහ ප්‍රඥාවයි. iv. ශ්‍රද්ධාව සහ භක්තියයි.

17. යුගල වශයෙන් සරත්ක වූ පුද්ගලයන් වශයෙන් අටක් වූ ඒ භාග්‍යවතුන් වහන්සේගේ ආර්ය සංඝයා දුර සිට හෝ සිවුපසය ගෙනවිත් පිරීමට සුදුසු ය. එබැවින් මහා සංඝරත්නය,

i. පාහුණෙය්‍යය වේ. ii. ආහුණෙය්‍යය වේ.

iii. දක්ඛිණෙය්‍යය වේ. iv. ඤායපටිපන්න වේ.

18. වෙසක් පුන් පොහෝ දින බුද්ධ රත්නය සහ ධම්ම රත්නය ලොව පහළ විය. සංඝ රත්නය පහළ වූයේ,

i. ඇසල පොහෝ දිනයේ දී ය. ii. දුරුතු පොහෝ දිනයේ දී ය.

iii. පොසොන් පොහෝ දිනයේ දී ය. iv. නිකිණි පොහෝ දිනයේ දී ය.

19. බුදු දහමේ විස්තර කෙරෙන "චතු අප්පමඤ්ඤාව" යනු,

i. සතර බ්‍රශ්ම විහරණයි. ii. සතර සංග්‍රහ වස්තුවයි.

iii. සතර අගතියයි. iv. චතුරාර්ය සත්‍යයයි.

20. ත්‍රිවිධ චෛත්‍ය වන්නේ,

i. බුදු, පසේබුදු, මහරහත් ii. රුවන්වැලි සෑය, ජේතවනාරාමය, අභයගිරිය

iii. ස්ථූපය, බෝධිය, බුදු පිළිම iv. ඇසතු, නා, නුග

21. භාවනාවට යොමු වන පුද්ගලයා විසින් හිඳීම, සිටීම, ඇවිදීම ආදී ඉරියව් පැවැත්වීම අවබෝධයෙන් සිදු කළ යුතු ය. එය ධර්මයේ හැඳින්වෙන්නේ,

i. ඉන්ද්‍රිය සංවරය නමිනි. ii. සති සම්පජඤ්ඤය නමිනි.

iii. වේදනානු පස්සනාව නමිනි. iv. කායානුපස්සනාව නමිනි.

22. සිදුහත් බෝසතාණන් වහන්සේ ගිහි ගෙය හැර යාමට හේතු වූ කරුණක් නොවන්නේ,

i. සතර පෙර නිමිති දැකීම. ii. රාහුල කුමරුගේ උපත සිදු වීම.

iii. නාටිකාංගනාවන්ගේ විප්‍රකාර දැකීම. iv. අන්‍ය තීර්ථකයන්ගේ බලපෑම.

23. විදර්ශනා භාවනාවෙන් ලැබිය හැකි උසස් ම ප්‍රතිඵලය වන්නේ,

i. නීවරණ ධර්ම යටපත් වීමයි. ii. නීවරණය අවබෝධ වීමයි.

iii. පංච අභිඤ්ඤා අෂ්ඨ සමාපත්තිය උපදවා ගැනීමයි. iv. සිත එකඟ වීමයි.

24. සමථ භාවනාව වැඩීමේ දී උපයෝගී කර ගන්නා කර්මස්ථාන ගණන වන්නේ,

i. විස්සකි. ii. තිහකි. iii. හතළිහකි. iv. පනහකි.

25. “කාලය, දීපය, කුලය, මව” යනුවෙන් හඳුන්වන්නේ,

i. පංච ශීලයයි. ii. පංච අභිඥ්ඥාවයි.

iii. පංච දුශ්චරිතයයි. iv. පංච මහා විලෝකනයයි.

26. බුද්ධ සාසනයේ සංඝ සමාජය ආරම්භ වූයේ,

i. සැරියුත් මහරහතන් වහන්සේගෙනි. ii. මුගලන් මහරහතන් වහන්සේගෙනි.

iii. යසකුල පුත්‍රයාගෙනි. iv. පස්වග මහනුන්ගෙනි.

27. සිදුහත් බෝසතාණන් වහන්සේ මනුෂ්‍ය ලොව ඉපදීමට පෙර සිටි ලොව වන්නේ,

i. අරූප ලොව ii. බ්‍රහ්ම ලොව iii. රූප ලොව iv. තුසිත ලොව

28. බුදුරජාණන් වහන්සේ සියලු කෙලෙසුන්ගෙන් දුරු වූ හෙයින් ද, රහසින්වත් පව් නොකළ හෙයින් ද, සියලු පුජාවන් ලැබීමට සුදුසු වූ හෙයින් ද,

i. “අරහං” නම් වන සේක. ii. “ලෝකවිදූ” නම් වන සේක.

iii. “භගවා” නම් වන සේක. iv. “බුද්ධෝ” නම් වන සේක.

29. බුදු දහමේ උගන්වන ආකාරයට පංච ඉන්ද්‍රිය හඳුන්වන්නේ,

i. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ නමිනි.

ii. රූප, වේදනා, සඥ්ඥා, සංඛාර, විඥ්ඥාන නමිනි.

iii. ඇස, කන, නාසය, දිව, ශරීරය නමිනි.

iv. චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, විඥ්ඥාන

30. “අනිත්‍ය දුක්ඛ අනාත්ම” යනුවෙන් හඳුන්වන්නේ,

i. තුන්තරා බෝධියයි. ii. ත්‍රිවිධ චෛත්‍යයයි.

iii. ත්‍රිවිධ ශික්ෂාවයි. iv. ත්‍රිලක්ෂණයයි.

31. සිතෙහි තරහව ඇති විට යමක් මතකයට නගාගත නොහැකි ය. එසේ වන විට සිතෙහි ක්‍රියාත්මක වන්නේ,

i. කාමච්ඡන්දයයි. ii. ව්‍යාපාදයයි. iii. ථීනමිද්ධයයි. iv. විචිකිච්චාවයි.

32. සිද්ධාර්ථ කුමාරයා ස්වයං වරයකින් විවාහයට තෝරාගත් යසෝදරා දේවියගේ පියාණන් වූයේ,

i. අමිතෝදන රජතුමා ය. ii. මීතෝදන රජතුමා ය.

iii. දණ්ඩපාහි රජතුමා ය. iv. සුප්‍රබුද්ධ රජතුමා ය.

33. මිනිසා, ගස ආදී ලෙස භාවිත වන සාමාන්‍ය ලෝක ව්‍යවහාරය හඳුන්වන්නේ,

i. “සම්මුති සත්‍ය” යන නමිනි. ii. “පරමාර්ථ සත්‍ය” යන නමිනි.

iii. “රූපස්කන්ධය” යන නමිනි. iv. “නාමස්කන්ධය” යන නමිනි.

34. බෞද්ධ අවමංගල අවස්ථාවල දී පාංශුකූලය පැවැත්වීමෙන් අපේක්ෂා කරන්නේ,

i. පරලොව සැපත් වූ පුද්ගලයා පිලිබඳ ගුණ කථනයක් ඉදිරිපත් කිරීමයි.

ii. අතීතයේ සිට පැවත එන චාරිත්‍ර විධියක් එලෙසින් ම පවත්වාගෙන යෑමයි.

iii. මියගිය පුද්ගලයා වෙනුවෙන් පිං පැමිණවීමයි.

iv. ජීවත්ව සිටින අයට පිනක් සිදු කර ගැනීමට අවස්ථාව සැලසීමයි.

35. සිව් බඹ විහරණවල ඇතුළත් මුදිතා ගුණයෙන් අදහස් වන්නේ,

i. සියලු දෙනාට හිතෛෂීව ජීවත් වීමයි. ii. දුකට පත්වූවන්ට පිහිට වීමයි.

iii. අනුන්ගේ දියුණුවට උදව් කිරීමයි. iv. අනුන්ගේ දියුණුව දැක සතුටු වීමයි.

36. "පඨවි, ආපෝ, තේජෝ, වායෝ" යනුවෙන් හඳුන්වන්නේ

i. සිව් බඹ විහරණයි. ii. සතර සංග්‍රහ වස්තුවයි.

iii. චතුරාර්ය සත්‍යයයි. iv. සතර මහා භූතයි.

37. ගැබිනි කාන්තාවන්ට ආශිර්වාද ප්‍රාර්ථනා කොට දේශනා කරන පිරිත් දේශනාව වන්නේ,

i. අංගුලිමාල පිරිතයි. ii. සීවලී පිරිතයි.

iii. ජය පිරිතයි. iv. බොජ්ඣංග පිරිතයි.

38. භාවනාවට පිවිසෙන තැනැත්තෙකු පූර්වයෙන් ඉටු කළ යුතු අවශ්‍යතාවක් නොවන්නේ,

i. කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ii. සිල්වත් වීම iii. ධර්ම ප්‍රචාරය iv. වීර්යය හා ප්‍රඥාව

39. සමථ භාවනාව හඳුන්වනු ලබන වෙනත් නමක් වන්නේ,

i. ප්‍රඥා භාවනාවයි. ii. ත්‍රිලක්ෂණ භාවනාවයි.

iii. චිත්ත භාවනාවයි. iv. ආනාපානසති භාවනාවයි.

40. ආජීව අෂ්ටමක සීලයෙහි අතුළත් නමුත් අටසිල් හි ඇතුළත් නොවන ශික්ෂා පදය කුමක්ද?

i. පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.

ii. පිසුනාවාචා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.

iii. මුසාවාදා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.

iv. අදින්නාදානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.

•